අධ්‍යාපන අමාත්‍යාංශය

අ.පොෂ. (සා.පෙළ) බුද්ධ ධර්මය උපකාරක සම්මන්ත්‍රණය 2018

පිළිතුරු පත්‍රය 1 කොටස

ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය		ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය		ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය		ප්‍රශ්න අංකය	පිළිතුරු අංකය	
1	2		11	3		21	1		31	3	
2	3		12	2		22	4		32	4	
3	2		13	3		23	2		33	1	
4	4		14	1		24	4		34	3	
5	1		15	2		25	3		35	1	
6	3		16	3		26	2		36	4	
7	3		17	4		27	1		37	3	
8	2		18	2		28	2		38	2	
9	1		19	1		29	2		39	3	
10	2		20	2		30	1		40	3	

පිළිතුරු පත්‍රය 11 කොටස

01.	1.	බාල දෙය අගය කර විකිණීම
	2.	කුසල් දහම් වැඩි දියුණු කරන මානසික අභ්‍යාසය භාවනාව යි.
	3.	බුබ්බුලාකාර, ධාන්‍යාකාර, ඝණ්ඨාකාර, ගඨාකාර,ආම්ලාකාර, පද්මාකාර
	4.	මුනිගුණාලංකාරය, සාරාර්ථසංග්‍රහය, රතනත්‍රය ගාථා ප්‍රණාම සන්නය, සතර බණවර සන්නය
	5.	ත්‍රිවිධ රත්නය කෙරෙහි කරුණු දැන ඇතිකර ගන්නා පැහැදීම
	6.	මුවදෙව්දාවත - මඛාදේව ජාතකය සසදාවත - සස ජාතකය
	7.	මිහින්තලේ කණ්ඨක චෛත්‍යයෙහි
	8.	මුල, මැද, අග මනා ව දේශනා කර ඇති බැවින්
	9.	චාරිත්‍ර - චාරිත්‍ර / සිරිත් - විරිත්
	10.	ඇමරිකානු ජාතික කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා රුසියානු ජාතික බ්ලැවැට්ස්කි මැතිනිය
2.	1.	කේසපුත්තයෙහි කාලාම වැසියන්ට
	2.	1. ආරංචි මාත්‍රයෙන් 2. පරම්පරාවෙන් පැවත එන නිසා 3. මෙය මෙසේ වී යැ යි කටකථා මගින්

		4. අපගේ ඉගැන්වීම සමග ගැළපේ යැ යි 5. මෙය තර්කානුකූල යැයි 6. න්‍යායානුකූල යැ යි 7. මතු පිට ස්වරූපයට අනුව 8. තම දෘෂ්ටිය අනුව සැසඳේ යැ යි 9. සුදුසු බව පෙනී ය යි 10. මේ ශ්‍රමණයා අපගේ යි ගුරුවරයා යැ ය
	3.	යමක් පිළිගැනීමට යොදා ගත යුතු නිර්ණායක වන 1. කුසල් ද අකුසල් ද 2 . නිරවද්‍ය ද සාවද්‍ය ද 3. නුවණැත්තන් විසින් ගරහන ලද්දේ ද වසන ලද්දේ ද 4. පිරිපුන් කොට සමාදන් කොට ගත් තැනැත්තාගේ අහිත පිණිස පවතී ද හිතසුව පනත පවතීද යන නිර්ණායක පදනම් කොටගෙන පිළිතුර ලිවිය යුතු ය. • මෙම නිර්ණායක පුද්ගලයාගේ කතාබහ ක්‍රියා අදහස් කෙරෙහි බලපාන සමබර පෞරුෂයක් ගොඩනැගෙන ආකාරය සාකච්ඡා කළ යුතු ය.
3.	1.	අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති අත්තනා අකතං පාපං අත්තනා ව විසුජ්ඣති සුද්ධි අසුද්ධි පච්චත්තං නාඤ්ඤ මඤ්ඤෝ විසෝධයේ
	2.	යමෙකු පව් කළොත් එයින් ඔහු ම කෙළසෙන්නේ ය. යමෙකු පව් නොකළොත් එයින් ම ඔහු පිරිසිදු වන්නේ ය. පිරිසිදුකම හා අපිරිසිදුකම පවතින්නේ තමා කෙරෙහි ම ය. එක් අයකුට තවත් අයෙකු පිරිසිදු කළ නොහැකි ය.
	3.	* පුද්ගලයෙකු දුක් කම්කටොළු සහිත ජීවිතයක් ගෙවන්නේ ද සැපවත් ජීවිතයක් ගෙවන්නේ ද තමා කළ පුණ්‍ය කර්ම හෝ පාප කර්ම හෝ මත ය. * පුද්ගලයාගේ චරිතය ගොඩනඟා ගත යුත්තේ ඔහු විසින්ම ය. * යහපත් ගුණධර්ම වලින් හෙබි පුද්ගලයෙකු සමාජයේ කැපී පෙනේ. එය එම පුද්ගලයා විසින් ම ගොඩනඟා ගත්තෙකි. * එමෙන් ම අයහපත් පුද්ගලයා ද එකී චරිත ලක්ෂණ තමා විසින් ම ගොඩනඟා ගත්තෙකි. මේ පිළිබඳ අදහස් දක්වා ඇත්නම් ලකුණු පිරිනමන්න.
4.	1./ 2	1. දානය - රටවැසියාගේ ආර්ථික සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය ලබා දීම 2. සීලය - කායික හා වාචසික සංවරයෙන් යුක්ත වීම 3. පරිත්‍යාගය - රට වැසියාගේ යහපත සඳහා තම කාලය ශ්‍රමය ධනය සුවපහසුව කැප කිරීම 4. ඍජු බව - බාධක හා බලපෑම් වලට යොමු නොවී සතර අගතියෙන් තොර ව යුක්තිය හා සාධාරණත්වය වෙනුවෙන් අවංකව කටයුතු කිරීම 5 . මෘදු බව - හදවතේ ඇති මොළොක් බව හෙවත් තෙත් ගතිය යි

		6. තපස - පසිඳුරන් පිනවීමට ගිජු නොවී ක්‍රියා කිරීම තපස යි. 7. අක්‍රෝධය - වෛරය සහගත බවින් මිදීම 8. අවිහිංසාව - කායික හා මානසික ව හිංසාවෙන් මිදීම 9. ඉවසීම - ක්ෂණික තීරණ වලට එළැඹ නොවී ඉවසිලිවන්ත ව ක්‍රියා කිරී ම. 10. අවිරෝධතා - මධ්‍යස්ථව හා ගැටුමින් තොර ව කටයුතු කිරීම
	3.	දස රාජ ධර්ම සිවුබඹ විහරණ පංචසීල ප්‍රතිපදාව සතර අගතිය දස සක්විති වත් සතර සංග්‍රහ වස්තු ආදිය උපයෝගී කොට ඒ ඇසුරින් පිළිතුරු ලියා තිබිය යුතුය.
5.	1.	අනිත්‍ය, දුක්ඛ, අනාත්ම
	2.	• අනිත්‍ය - වෙනස්වන සුළු බව (පංචස්කන්ධය ම වෙනස්වීමට භාජනය වේ) • දුක්ඛ - ලෝකයේ සියල්ල වෙනස් වන බැවින් දුක් සහිත වේ. ජාති ජරා ව්‍යාධි මරණ ආදි සියල්ල දුක් සහිත වේ. • අනාත්ම - සියල්ල අනිත්‍ය හා දුක් සහිත බැවින් මම ය මගේ යැයි ගත හැකි කිසිවක් නැත.
	3.	අනිත්‍ය දේ අනිත්‍ය ලෙසත් දුක් සහිත දේ දුක් ලෙසත් අනාත්ම දේ අනාත්ම ලෙසත් හඳුනා ගැනීමට බුදු දහම මග පෙන්වයි. * එවිට පුද්ගලයා අසීමිත ආශාවන්ගෙන් තොර වේ. * අල්පේච්ඡ බව අගය කරමින් පුද්ගල චරිතය ගොඩනැගේ. * පහසුවෙන් පෝෂණය කළ හැකි ලද දෙයින් සතුටට පත්වේ. * තිලකුණු දන්නා තැනැත්තා අකම්පිත ය අටලෝදහමින් කම්පා නොවේ. * මැදහත් උත්සාහවන්ත චරිතයක් තිලකුණු හඳුනාගැනීමෙන් ගොඩනැගේ.
6.	1.	මෙරට පැරණි ම සිංහල බෞද්ධ සාහිත්‍ය කෘති
	2.	ධර්ම ප්‍රදීපිකාව - ගුරුළුගෝමී පඬිතුමා පුජාවලිය - මයුරපාද පරිවේනාධිපති බුද්ධපුත්‍ර හිමි සද්ධර්ම රත්නාවලිය - ධර්මසේන හිමි
	3.	*මෙරට සිංහල සාහිත්‍ය කෘති බුදුදහමින් පෝෂණය වී ඇත. ‘‘පෙදෙන් බුදු සිරිත-බසින් වත් සිරිත් ඈ’’ *එබැවින් සාධු සම්මත සමාජයක් ගොඩනැගීමට වන පිටිවහල අපමණ ය. *ජාතක කතා පොත සත්ත්ව චරිත යොදා ගනිමින් ජීවිතාදර්ශ සපයයි. *උත්සාහය, කළගුණදම්, මව්පිය ගුණ, එකමුතු බව ආදී යහපත් සමාජයක් ගොඩනැගීමට දායක වන කාරණා ඒවායෙහි අසීමිත ය.

		*සද්ධර්ම රත්නාවලිය ගැමිවහර උපයෝගී කොටගෙන ජීවිතාදර්ශ සපයයි මෙහි සෑම කතාවකම අරමුණ දක්වා ඇත *දහම් සරණ සහ සරණ බුත්සරණ අමාවතුර ආදී සෑම ග්‍රන්ථයකින් ම පාහේ යහපත් සමාජයකට දායක වන උපදෙස් ගුණධර්ම අන්තර්ගත වේ.
7	1.	10 ශ්‍රේණිය 06 පාඩම 37-39 පිටු
	2.	10 ශ්‍රේණිය 05 පාඩම 28- 32 පිටු
	3.	11 ශ්‍රේණිය 17 පාඩම 118 -122 පිටු
	4.	11 ශ්‍රේණිය 18 පාඩම 132-133 පිටු

7). 1දුටුගැමුණු රජු

#. මූලික තොරතුරු

*පියා කාවන්තිස්ස රජු වන අතර මව විහාර මහා දේවියයි එකම සොයුරා සද්ධාතිස්ස වේ. මෙතුමා රුහුණු රජ පෙළපතට අයත් ය

*''මාගේ මේ ව්‍යායාමය බුද්ධශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසිකලෙකත් රජ සැප පිණිස නොවන්නේය''යන පාඨය පෙරදැරිව මෙතුමා ක්‍රියා කළේය

*එවකට අනුරාධපුරය පාලනය කළ එළාර නම් රජුට විරුද්ධව සටන් කළ බව මහාවංශයේ සඳහන් වේ.

මෙතුමා කාලයක් තම රත් තම පියරජතුමා සමඟඅමනාපව කොත්මලේ ප්‍රදේශයේ විසූ බව සඳහන් වේ

*පිය රජුගෙන් පසුව රුහුණේ පාලකයා වූ දුටුගැමුණු කුමරු තම මවගේ භික්ෂූන් වහන්සේගේ ත්ආශිර්වාද ලබා සේනා සන්නද්ධව අනුරාධපුරය ආක්‍රමණය කොට vijithapuraනම් ස්ථානයේ දී තීරණාත්මක සටනකින් ජය ලබා ත්‍රිසිංහලය එක්සේසත් කළේය

ශාසනික සේවා

*මිරිසවැටියරුවන්වැලිසෑයලෝවා මහා ප්‍රාසාදය නිර්මාණ වේ.

*මහා විහාරය ප්‍රතිසංස්කරණය කළ බවද සඳහන් වේ

*මෙතුමාගේ රාජ්‍ය කාලය තුළ වෙසක් උත්සව විසි හතරක් පැවැත්වූ බව මහාවංශයේසඳහන් වේ

*ආරෝග්‍යශාලා පිහිටුවා ගිලන්හල සේවාවක් ආරම්භ කිරීම ද දුටුගැමුණු රජතුමාගේ මෙහෙවරකි

*තමා විසින් කරන ලද සියලු යහපත් ක්‍රියා සිය පින් පොතෙහි සටහන් කරගැනීම මෙතුමාගේ චරිතයෙහි සුවිශේෂී ලක්ෂණයකි

*පින් පොතට සවන් දෙමින් රුවන්වැලිසෑය දෙස බලා කාලක්‍රියා කළ බව සඳහන් වේ

2.විදර්ශනා භාවනාව

*පංචස්කන්ධය දෙස ගැඹුරින් බැලීම විපස්සනාවයි

*ප්‍රඥා භාවනාවතිලකුනු භාවනාව වශයෙන් ද හැඳින්වේ

*මේ තුළින් ජීවිතයේ යථා ස්වභාවය අවබෝධ වේ

*''visesenaපස්සතීති විපස්සනා''යනුවෙන් එය දක්වා ඇත.

ආනිසංස

*ජීවිතයේ යථා ස්වභාවය අවබෝධ වීම

*ඊර්ෂ්‍යා ක්‍රෝධ ආදියෙහි එල රහිත බව අවබෝධ වී ඉන් මිදීම

*දූෂිත සිතිවිලි පාලනය වී ඉවසීම හා බුද්ධිමත්ව කටයුතු කිරීම වැනි ගුණාංග ජීවිතයට එක් වේ

*අටලෝ දහමින් කම්පා නොවීමටහුරුවීම

3 .. මහනුවර යුගයේ චිත්‍ර

*සිතුවම් දැකිය හැකි ස්ථාන-. දෙගල්දොරුව විහාරය මැදවල විහාරය රන්ගිරි දඹුලු විහාරය රිදී විහාරය බඹරගල විහාරය කැලණි පැරණි විහාර මන්දිරය

*චිත්‍ර ඇඳි චිත්‍ර ශිල්පීන්-. දේවේන්ද්‍ර මූලාචාරියාණිරියාලනයිදේදෙවරගම්පල සිල්වත් තැන

*විශේෂ ලක්ෂණ-1. පළමුවෙන් රූපවල බාහිර රේඛාව ඇද දෙවනුව වර්ණ යොදා රූපය සම්පූර්ණ කිරීම

2. රතු සුදු කළු වර්ණ බහුලව භාවිත කිරීම

3. සුදු පැහැති සිතුවම් රතු පසුබිමේ දක්නට ලැබීම

4.අඛණ්ඩ කථන ක්‍රමය දක්නට ලැබේ

5 සිතුවම් තාත්වික නොවේ

6 පර්යාවලෝකනයදක්නට නැත පරිමාණ පරිමාණුකූල නොවේ

7 සිතුවම් බුද්ධිගෝචර නොවන අතර ඒවා දෘශ්‍ය ගෝචර වේ

4. මහින්දාගමනය

11 ශ්‍රේණිය17 පාඩම ඇසුරින්